ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

Prestige plus ගිණුම				
නිමැවුමේ ස්වභාවය	**ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ**	**ආරම්භක තැන්පතු හා ගාස්තු**	**සුදුසුකම්**	**ප්‍රධාන නියම හා කොන්දේසි**
BOC Prestige Plus පුද්ගලික ජංගම ගිණුම අතිශයින්ම වෘත්තිකයන් හා විධායක නිලධාරීන් වෙනුවෙන් නිර්මාණය කර ඇත.	• එක් එක් චෙක්පතෙහි ගිණුම්හිමියාගේ නම මුද්‍රිත එකිනෙකට වෙනස් ආකාරයෙන් නිර්මිත චෙක්පොත • ඇතුළත්වීමේ ගාස්තු නොමැතිව ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත්කිරීම • අන්තර්ජාල හා ජංගම බැංකුකරණ පහසුකම් • මුදල් ආපසුගැනීමේ එක් දින සීමාව වැඩි කරන ලද ජාත්‍යන්තරව පිළිගත් විශේෂ ඩෙබිට් කාඩ්පත • ඉක්මන් චෙක්පත් නිශ්කාෂණය • චෙක්පොත් එක් දිනක් ඇතුළත භාරදීමේ ක්‍රමය • SMS Alert පහසුකම	• **ආරම්භක තැන්පතුව – රු. 30,000/-** • **ගිණුම වසාදැමීමේ ගාස්තු – රු..500/-** • **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු** - මාසික සේවා ගාස්තු - අවම අයිරා පොලිය - චෙක්පත් අගරුවීමේ ගාස්තු - ගෙවීම නතරකිරීමේ ගාස්තු - ජංගම ගිණුම් ප්‍රකාශ ගාස්තු - බැංකු ප්‍රකාශ අනු පිටපත් නිකුතුව - චෙක්පොත් සඳහා දරන පිරිවැය - මුදල් ඇණවුම් සකස්කිරීම - ගිණුම් ශේෂයන් තහවුරු කිරීම - ස්ථාවර නියෝග වෙත ලියාපදිංචිවීම හා මුදල් හුවමාරුකිරීම - SMS Alerts ගාස්තු - ATM කාඩ්පත් නිකුත්කිරීම - ATM වෙතින් මුදල් ගැනීමේ සීමාව වෙනස්වීම - අන්තර්ජාල බැංකුකරණ සේවා ගාස්තු ගාස්තු දැනගැනීමට https://www.boc.lk/rates-tariff#general-tariff වෙත • **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යස්ථාපිත අයබදුවලට යටත් වේ.	- **වෘත්තිකයන්**: රැකියාවල නියුතු හෝ ස්වයං රැකියාවල නියුතු (වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, නීතිඥවරුන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, ගණකාධිකාරවරුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්) - පිළිගත් පෞද්ගලික ආයතනවල හෝ සමාගම්වල **විධායකයින්** - රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය සංවිධානවල **මාණ්ඩලික නිලධාරීන්** (මාසික දළ ආදායම රු. 40,000/- ඉක්මවන) **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** - ජාතික හැඳුනුම්පතේ (NIC)/ NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්; - දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන; - ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග, ඉතිරිකිරීමේ/ජංගම ගිණුම් විවෘතකිරීමේ විශේෂ අයදුම්පත සම්පූර්ණ කර ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.	- මෙම ගිණුමේ සෑම කොන්දේසියක්ම සහ එමගින් ප්‍රදානයකරන සෑම පහසුකමක්ම වෙනස්කිරීමේ, එකතුකිරීමේ හෝ සංශෝධනයකිරීමේ අයිතිය බැංකුව සතුවේ. - නිමැවුමට අදාළ සියලුම නියම හා කොන්දේසි සඳහා ගිණුම විවෘතකිරීමේ අයදුම්පත බලන්න.

Classification: Internal

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.

අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.
- දුරකතන: +94 11 220 4750 / +94 11 243 5814 ෆැක්ස්: +94 11 243 5815 විද්‍යුත් ලිපිනය: bocexmgt@boc.lk වෙබ් අඩවිය: https://www.boc.lk
- තැපැල: ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

  අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.